# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 ජනවාරි මස 17 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි

### බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.35 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල (විපක්ෂ නායකතුමා)

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අසෝක රන්වල
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඊ.ඒ. නන්දන පත්මකුමාර
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවරදන්
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කොලන්නගේ වජිර පෙරේරා
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මංජුල බුද්ධදාස
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොයිස් විජිත
ලලන්ත ගුණසේකර
විජිත් ප්‍රියන්ත
සෙනල් වෙල්ගම
ශ්‍රීනාත් පෙරේරා

## 01. සභාපතිවරයාගේ නිවේදනය :

*i*

*"ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින්, 2017 ජනවාරි මස 09 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (5) (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් එවා තිබෙන බවත්,*

*2017 ජනවාරි මස 10 දින සිට එක් මාසයක් ඇතුළත පළාත් සභාවේ අදහස් ලබා දෙන ලෙසත්, එසේ එක් මාසයක කාලයක් තුළ මෙම පළාත් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට නොලැබුණහොත්, පනත් කෙටුම්පත පිළිබඳව පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 46 අ (2) ආ ප්‍රකාරව ක්‍රියා කිරීමට පියවර ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත :

එවලේ ගරු සභාපතිතුමා විසින් එකී පනත් කෙටුම්පත පිළිබඳ 2016.10.18 දින පළාත් සභා රැස්වීමේදී එකඟතාව ලබා දෙමින් පළාත් සභාව විසින් ගනු ලැබූ තීරණයන් වන,

i. පනත් කෙටුම්පතෙහි 2 වගන්තියෙහි සඳහන් අරමුණුවලට සීමාවන පරිදි හා තිරසාර සංවර්ධන ඉලක්ක 17 අතරින් ශ්‍රී ලංකාවට ගැළපෙන ඉලක්ක හඳුනා ගෙන එම ඉලක්ක පමණක් ඇතුළත් වන පරිදි පනත් කෙටුම්පතේ පූර්විකාව සකස් කිරීම.

ii. පනත් කෙටුම්පතේ 2 (ඇ) හි [2 වන පිටුවේ 5 වන පේළියේ] "ඒකාබද්ධ වන පරිදි" යන පද වලට අනතුරුව "හා සමබරතාවය රැකෙන පරිදි" යන පද ඇතුළත් කිරීම.

iii. පනත් කෙටුම්පතේ 4 (i) (අ) හි (i) අනු වගන්තිය ඉවත් කිරීම.

iv. පනත් කෙටුම්පතේ 4 (i) (ආ) හි (iii) හි [3 වන පිටුවේ 6 වන පේළිය] "සාමාජිකයන් දෙදෙනෙක්" යන පද වෙනුවට "සාමාජිකයන් එක් අයෙකු" යන පද ඇතුළත් කිරීම.
[ඉහත (iii) හි සඳහන් සංශෝධන පිළිගන්නේ නම්]

v. සෑම පළාත් සභාවකින්ම නියෝජනයක් ඇති වන පරිදි එක් එක් පළාත් සභා විසින් නම් කරනු ලබන සාමාජිකයන් 9 දෙනෙකු ඇතුළත් වන ආකාරයට පනත් කෙටුම්පතේ 4 (1) (ආ) හි (iv) අනුවගන්තිය සංශෝධනය කිරීම.

vi. පනත් කෙටුම්පතෙහි 10 (එ) හි "විගණන" යන පද වෙනුවට "තිරසාර සංවර්ධනයට අදාළ යාන්ත්‍රණ විගණන" යන පද යෙදීමෙන් එම වගන්තිය සංශෝධනය කිරීම.

vii. පනත් කෙටුම්පතේ 10 (ඕ) වගන්තියට අදාළව, එම වගන්තියට පහළින් දක්වා ඇති ඡේදයේ අවසාන වාක්‍යයට පසුව එවැනි "ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ පරිත්‍යාගයක් ලබා ගැනීමේදී කිසිදු බලපෑමකට, කිසිදු කොන්දේසියකට යටත් නොවිය යුතුය" වශයෙන් වන වාක්‍යයක් එකතු කිරීමෙන් එම ඡේදය සංශෝධනය කිරීම.

viii. පනත් කෙටුම්පතේ 11 (7) වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම.

තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට හා උපාය මාර්ගයට අනුකූලව ක්‍රියා කිරීම රජයේ හා පළාත් සභාවේ සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයකම හා සෑම පළාත් පාලන ආයතනයකම කාර්ය භාරය විය යුත්තේය.

යනුවෙන් සඳහන් කරමින්, එකී තීරණයන් ඇතුළත්ව පළාත් සභාවේ අදහස දැනටමත් අතිගරු ජනාධිපතිතුමා වෙත යවා ඇති බැවින්, එයම පාර්ලිමේන්තුව වෙත යැවීමට නම් කාර්ය පටිපාටි රීති 63 න් බාධාවක් නොවී සභාවේ එකඟතාව ඇතිව ක්‍රියා කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදුව, සභාව ඊට විරෝධය පළ නොකළ බැවින්, ගරු සභාපතිතුමා විසින් 2016.10.18 දින සභාවේදී මෙම ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත සම්බන්ධව මෙම සභාව ගන්නා ලද තීරණය එලෙසින්ම පාර්ලිමේන්තුව වෙත දන්වා යැවීමට සභාවේ එකඟතාවය විමසන ලදුව, සභා සම්මත විය.

අනතුරුව එම තීරණයන් පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත දන්වා යවන ලෙස ගරු සභාපතිතුමා විසින් සභා ලේකම් වෙත දැනුම් දෙන ලදී.

## 03. කාරක සභා වාර්තා :

i. 2016.11.01 වන දින හා 2016.12.06 වන දින පැවැති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තා.

ii. 2017.01.04 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා.

අනතුරුව, 2016.11.08 සහ 22 වන දිනවල පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව [කාරක සභාවේ සභාපති වෙනුවෙන්] රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලදී.

***පූ.භා. 10.44 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

## 04. පළාත් සභාවේ කටයුතු :

ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."*

## 05. බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ට අදාළ සංශෝධිත අතුරු ව්‍යවස්ථාව :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදනු ලැබ,*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1976/21 හා 2016.07.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද පහත සඳහන් කෙටුම්පත් සංශෝධිත අතුරු ව්‍යවස්ථා, එනම්, හඳුන්වනු ලබන නමින් ඒ කවරේද යත්,*

*i. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

*ii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

*iii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් හා ලැගුම්හල් පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

*iv. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

v. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

vi. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

vii. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා භූමි පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

viii. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

ix. *ප්‍රාදේශීය සභා මාර්ගයන්හී බර සහ වේග සීමා පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

x. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෝජන ශාලා පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

xi. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

xii. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

xiii. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

xiv. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදාහනාගාර පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව හා*

xv. *ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව*

*යන කෙටුම්පත් සංශෝධිත අතුරු ව්‍යවස්ථාවන් ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ අනුමත කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි යන යෝජනාව කරමින්ම පෙර කී කෙටුම්පත සංශෝධිත අතුරු ව්‍යවස්ථාවන් මෙම පළාත් සභාවට ඉදිරිපත් කරන ලදී."*

***අ.භා. 12.50 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනා :

න්‍යාය පත්‍රයේ අංක **X** යටතේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් පෞද්ගලික මන්ත්‍රී යෝජනා 01 සහ 02 ක එකී ගරු මන්ත්‍රීතුමා විසින් එකවර විවාදයට භාජනය කිරීමට කැමැත්ත ප්‍රකාශ කරමින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවට සභාව විරුද්ධ නොවූයෙන්, අනතුරුව සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා දෙකම පිළිවෙළින් සභාවට ඉදිරිපත් කරන ලදුව, සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

**[පෞද්ගලික මන්ත්‍රී යෝජනාව 01]**

*"සුදුසු නිවාසයක වාසය කිරීම ජනතාවගේ මානව අයිතිවාසිකම් ලෙසට ජාත්‍යන්තර විශ්ව ප්‍රකාශනවල පවා පිළිගෙන ඇත. ජාත්‍යන්තර නීතියට අනුව ශ්‍රී ලංකාව දෙස බැලීමේදී සුදුසු නිවාසයක් තබා ජීවත්වීමට සරිලන අවම පහසුකම්වත් නොමැති නිවාස, ජනතාවට ලබා දී ඇති බව බැලූ බැල්මට පෙනෙන කාරණයකි. එසේ නිවාස ලබා දී ඇත්තේ ඇතැම් අවස්ථාවලදී ඔවුන් ජීවත් වූ ස්ථිර භූමිභාග රජයට අත්පත් කර ගැනීමෙන් අනතුරුවය. එසේ අත්පත් කර ගැනීමේදී කිසිදු ආකාරයක වන්දි මුදලක් එම ස්ථානවලන් ඉවත් කළ ජනතාවට ලැබී නොමැත. ඔවුන්ට ලැබී ඇත්තේ කුලී නිවාස පදනම මත තට්ටු නිවාසය. ඒවායෙහි ජීවත් වීමට අවම පහසුකම් පවා නොමැති බව කිය යුතුය.*

*එසේ හෙයින් ඔවුන්ගෙන් ලබා ගත් භූමි භාගයන් සඳහා වන්දි මුදල් නොගෙවා ඇත්නම් සහ තට්ටු නිවාසනවලින් නිවාස ලැබී ඇත්නම් ඒවායෙහි අය කරන කුලිය කපා හැරීමට කටයුතු කරන මෙන්ද ඉදිරියේදී*

*අඩු තරමින් වර්ග අඩි 750 ක පමණ නිවසක්වත් ජනතාවට ලබා දීමට කටයුතු කරන මෙන් ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

**[පෞද්ගලික මන්ත්‍රී යෝජනාව 02]**

*"පසුගිය ආණ්ඩු සමයේ නාගරික සංවර්ධන අධිකාරිය හරහා නාගරික සංවර්ධනයට ඉඩම් අත්පත් කර ගැනීමේදී අදාළ ඉඩම්වල පදිංචිව සිටි තැනැත්තන් හට බොහෝ අවස්ථාවල වන්දි ප්‍රදානයකින් තොරව බලහත්කාරී ලෙස ඉඩම් අත්පත් කර ගැනීම් සිදු විය.*

*වත්මන් ආණ්ඩුව යටතේ ද එකී නරක පූර්වාදර්ශය ඉදිරියට යමින් කොළඹ මහ නගර සභාව ආශ්‍රිත වතු ඉඩම් රාශියක මෙන්ම පොදුවේ බස්නාහිර පළාත තුළම ඉඩම් අත්පත් කර ගැනීම් වන්දි ප්‍රදානයකින් තොරව සිදු වන බවට ජනතාවගෙන් මැසිවිලි නැගෙන අතර ඉහත තත්ත්වය ඉඩම් අත්පත් කර ගැනීමේ අණපනත් අමු අමුවේ උල්ලංඝණය වීමක් වන අතරම ඉතා නරක පූර්වාදර්ශයක්ද වනු ඇත. එබැවින් වන්දි ප්‍රදානයකින් තොරව නාගරික සංවර්ධනයට ඉඩම් අත්පත් කර ගැනීම නොකළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කරයි."*

***ප්‍රශ්න සභාභිමුඛ කරන ලදී.***

***අනතුරුව, පෞද්ගලික මන්ත්‍රී යෝජනා 01 හා 02 පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ප්‍රශ්න :

**පරිසර විෂයය සම්බන්ධව ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින්, සභාව කල් තබන අවස්ථාවේදී ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්න :**

අ. හෝමාගම, හොරගල, ඉද්දගල මීටි බැවුම සහිත කඳු ප්‍රදේශයේ මහ පරිමාණ ගල් කොරියක් නිසා ජනතාවට හානිකර තත්ත්වයක් ගැන ඔබතුමා දන්නේද?

ආ. භූගත ජලය සිඳීයාම, අවට නිවාස ඉරිතලා යාම ඇතුළු පරිසර හානි පිළිබඳව මෙම ගල්කොරියට විරුද්ධව මහජන උද්ඝෝෂණ පැන නැගී ඇති බව දන්නේද?

ඇ. පළාත් පරිසර, නීතිය හා සාමය යන විෂයන් භාර අමාත්‍යවරයා ලෙස මහජනතාව මුහුණ දෙන මෙම ගැටළු පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග කවරේද?

**ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයය සම්බන්ධව සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින්, සභාව කල් තබන අවස්ථාවේදී ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්න :**

අ. ඉහත සඳහන් විෂයන් භාර අමාත්‍යවරයා හා ප්‍රධාන අමාත්‍යවරයා වන ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ උපදේශකවරුන් සිටීද?

ආ. ඔවුන් කොපමණ පිරිසක් ද? ඔවුන් කවර විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධව කටයුතු කරන්නේ ද?

ඇ. ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ සේවය කරන උපදේශකවරුන්ගේ නම් සභාගත කළ හැකි ද?

ඈ. ඔබතුමා ප්‍රධාන අමාත්‍යවරයා ලෙස පත්වීමෙන් පසුව නම් කළ උපදේශකවරුන් කවරෙකු හෝ පසුව ඉවත් කළේ ද? ඉවත්ව ගියේ ද? ඔවුන් නම් කළ හැකි ද?

ඇ. ඔබතුමා මහ ඇමැතිවරයා ලෙස පත්වීමෙන් පසුව නම් කළ උපදේශකවරුන්ගෙන් කවරෙකුට හෝ විදේශ විනිමය, මූල්‍ය හෝ වෙනත් සම්පත් අවභාවිත කිරීම් පිළිබඳ කිසියම් චෝදනාවක් එල්ල වූයේ ද? එසේ නම් ඔවුන්ගේ නම් සහාගත කළ හැකි ද? නොහැකි නම් ඒ මන්ද?

***පිළිතුරු සැපයීමට ගාමිණී තිලකසිරි [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] ගරු අමාත්‍යතුමා විසින් එකී ප්‍රශ්න සඳහා සති දෙකක් කල් ගන්නා ලදී.***

## 08. කල් තැබීමේ යෝජනාව :

ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.01 ට, 2016 පෙබරවාරි මස 07 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.01.18
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/18
Minuts 2017.01.18 - Hansard Sectionr